## පළමුවන කියැවීම

බාරුක් 5:1-9

බාරුක් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**මිහිපිට සෑම ජාතියකට ම ඔබේ මහිමය පෙන්වනු ලබන්නේ ය.**

එම්බා, ජෙරුසෙලම් නගරය, දුක් වේදනාවේ වස්ත්‍රය ඉවතලා, දෙවි මහිමයේ ශෝභනකම සදහට ම ඇඟලාගන්න. දේව අවංකකම නමැති සළුව පැළඳගන්න. ඔබ සිරස මත සදාතනිකයාණන්ගේ තෙදබල කිරීටය තබා ගන්න. මන්ද, මිහි පිට සිටින සෑම ජාතියකට ම ඔබේ මහිමය පෙන්වීමට දෙවිදාණෝ සලසන සේක. දෙවිදාණන් ඔබට දෙන නාමය සදා පවතින්නේ ය. සාමය උදාවූයේ අවංකකමිනි. ගෞරවය උදාවූයේ ලැදිකමිනි. ජෙරුසෙලම, නැගිට උස් තැන්හි සිට ගන්න. ඔබේ දෙනෙත් පෙරදිගට හරවන්න. සුවිශුද්ධ තැනැන්වහන්සේගේ අණට එකගව පෙර අපර දෙදිගින් රැස්වී සිටින ඔබේ දරුවන් දෙස බලන්න. දෙවිදාණෝ ඔවුන් සිහිපත් කළ සේක කියා ඔව්හු ජයගොස නගති. සතුරන් නමැති පිරිවර ඇතිව ඔව්හු පයින් පිටත් වී ගියහ. එහෙත් දැන්, තේජාන්විත ව, උසුලාගෙන යන රජකුමරුන් මෙන් දෙවිදාණෝ ඔවුන් ඔබ වෙත ගෙනෙන සේක. මන්ද, දේව මහිමාලංකාරයෙහි සුවසේ ඉශ්රායෙල් ජනයා ගමන් කරන පිණිස දෙවිදාණන් සියලු උස් කඳුවලට ද සදාතන කඳුවලට ද සම භූමියක් වීමටත්, මිටියාවත් පිරී සමතලා භූමියක් වීමටත් නියම කර ඇත. දේව අණට එකග ව වන රොද හා සෑම සුවඳ කුසුම් ගසක් ඉශ්රායෙල් ජනයා හට සෙවන දෙනු ඇත. දේව දයාව සහ අවංකකම පිරිවර මෙන් ඇතිව ස්වකීය මහිමාලෝකයෙහි ප්‍රීතියෙන් යාමට ඉශ්රායෙල් ජනයාට මඟ පෙන්වන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 126:1-6

පිළිතුර: සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.

ගීය: සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය. එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු.

එවිට, “සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ”යි විජාතීහු කියන්නට ගත්හ. සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වෙමු.

සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇළදොළ මෙන් අපට යළි ගෙන දුන මැනව. දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙලා ගන්නෝ ය.

ඔව්හු වී මළු රැගෙන කඳුළු සල සලා පිටත්ව ගිය නමුත්, තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## දෙවන කියැවීම

පිලිප්පි 1:3-6, 8-11

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**“ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනය සඳහා නිදොස් ව, අවංක ව සිටින්න.”**

මට ඔබ සිහි වන සෑමවිට ම මම මාගේ දෙවියන් වහන්සේට ස්තුති කරමි. මා යාච්ඤා කරන සෑමවිටම, ඔබ සියලු දෙනා උදෙසා යාච්ඤා කරමින් ප්‍රීතියෙන් පිරී

සිටිමි. මා එසේ කරන්නේ පළමු දවස පටන් මේ වන තුරු ධර්මදූත සේවයට ඔබ සහභාගි වූ නිසා ය. ඔබ තුළ යහපත් කාර්යයක් ඇරඹූ උන් වහන්සේ, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ දවස පැමිණීමේදී එය සම්පූර්ණ කරනු ඇතැයි මම ඒකාන්තයෙන් ම විශ්වාස කරමි. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ හද පත්ලෙන් ම ගලා එන ප්‍රේමයෙන් මා ඔබට සැබැවින් ම ප්‍රේම කරන බව දෙවියන් වහන්සේ දන්නා සේක. ඔබ උදෙසා මාගේ යාච්ඤාව මේ ය. විශිෂ්ටතම දේවල් වටහා ගැනීමට හැකි වන පිණිස දැනගැන්මෙන් හා සියලු ආකාර විමසීමෙන් ඔබගෙන් ප්‍රේමය බොහෝ සෙයින් වර්ධනය වේවා. ක්‍රිස්තුස් වහන්සේගේ දවස දක්වා අවංක ව හා නිදොස් ව සිටීමට ඔබට හැකි වේවා. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණ කොටගෙන දෙවියන් වහන්සේගේ ගෞරවය හා ප්‍රශංසාව පිණිස ඔබ දැහැමි ජීවිතයක පලවලින් පූර්ණ වේවා.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ලූක් 3:4,5

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ මඟ පිළියෙළ කරන්න. එතුමන් හට ඇද නැති මාවත් සාදන්න.
දෙවියන් කෙරෙන් වන විමුක්ති මාර්ගය සව් සත දකිනු ඇත.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 3:1-6

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**සව්සත දෙවියන් කෙරෙන් විමුක්ත් මඟ දකිනු ඇත.**

තිබේරියස් අධිරාජයා රජ පැමිණී පසලොස් වන අවුරුද්දෙහි පොන්තියස් පිලාත් ජුදයට ආණ්ඩුකාරයා ව ද හෙරෝද් ගලීලයට යුවරජුව ද ඔහුගේ සහෝදර පිලිප් ඉතුරයටත්, ත්‍රිකෝනියටත් යුවරජු ව ද ලුසානියස් අබිලේනියට යුවරජුව ද අන්නස් හා කායාපාස් උත්තම පූජක වරයන් ව ද සිටි සමයෙහි, දෙවියන් වහන්සේගේ පණිවුඩය පාළුකරයෙහි සෙකරියස්ගේ පුත් ජුවාම් වෙත පැමිණියේය. තවද ඔහු ජොර්දන් ගඟ අවට පෙදෙස මුළුල්ලෙහි සැරිසරමින් පව් කමාව පිණිස මනස්ථාපනය වී සිත් හරවාගෙන බව්තීස්ම ස්නාපනය ලබන්නැයි ප්‍රකාශ කෙළේය. එපවත් දිවැසිවර ඉසයියස්ගේ ලියවිලිවල මෙසේ ලියා ඇත. "සමිඳුන්ගේ මඟ පිළියෙළ කරන්න, එතුමන් හට ඇද නැති මාවත් සාදන්න. සියළු කඳුරැලි පුරවනු ලැබේ. සියළු කඳු හා හෙල් සමතලා කරනු ලැබේ. සියළු වංගු ඇද හරිනු ලැබේ. රළු මාවත් මට්ටම් කරනු ලැබේ. දෙවියන් කෙරෙන් වන විමුත් මඟ සව් සත දකිනු ඇතැයි පාළුකරයෙහි මොරගා කියන හඬෙකි."

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.